# <u>නිවේදනය</u>

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2019(2020) – දෙවන වටය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2019(2020) සඳහා එක් එක් විෂය යටතේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සියලුදෙනාගේ නාමලේඛනය මෙහි දැක්වේ.

මෙම ලේඛනවල නම් සඳහන් සියලුම අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙහි සඳහන් සියලු අයදුම්කරුවන් 2026.08.11 දින පෙ.ව.7.00 වනවිට අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 7 වන මහළ ශ්‍රවණාගාරය වෙත වාර්තා කළ යුතු වේ.මෙම නාම ලේඛනයේ නම සඳහන් වීම/ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා තිබීම පමණක් අදාල පත්වීම් ලැබීමට සුදුසුකමක් නොවේ.

මෙහි ඇමුණුම 01 වශයෙන් දැක්වෙන ආකෘතිය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යයවන අතර එය අදාල විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීගේ අත්සනින්ම තහවුරු කර තිබිය යුතුය. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු මෙම ආකෘතිය පසු අවස්ථාවක ඉදිරිපත් කළහොත් බාර නොගන්නා බැවින් එය වෙබ් අඩවියෙන් බාගත කරගෙන කඩිනමින් සම්පූර්ණ කරවා ගැනීම අයදුම්කරුගේ වගකීමක් වේ.